ජනාධිපති ලේකම් කාර්යාලය
ஜனாதிபதி செயலகம்
THE PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

කොළඹ 1.
கொழும்பு 1.
Colombo 1.

චක්‍රලේඛ අංක: ආර්ඊඩී/99/01

1999 පෙබරවාරි 26 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්
ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ස්වේච්ඡා සමාජසේවා සංවිධාන/රාජ්‍ය නොවන සංවිධාන නැවත ලියාපදිංචි කිරීම**

සංවර්ධනය, සහනාධාර, පුනරුත්ථාපනය හා අදාල වෙනත් කටයුතුවල වැදගත් කාර්යභාරයක් ඉටුකිරීමෙන් දායක වන ස්වේච්ඡා සමාජසේවා සංවිධාන/රාජ්‍ය නොවන සංවිධාන විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වේ.

2. දැනට මෙම සංවිධාන, විවිධ නීති යටතේ විවිධ ආයතනවල ලියාපදිංචි කිරීමෙ හේතුවෙන් ඒවායේ ක්‍රියාකාරකම පිළිබඳ තොරතුරු ලබාගැනීම උගහට වී ඇත. එමනිසා, මෙම සංවිධානවලින් කෙරෙන වැඩකටයුතු පිළිබඳ නිසියාකාර වාර්තා තබාගැනීමටත්, මෙම ස්වේච්ඡා සමාජසේවා/රාජ්‍ය නොවන සංවිධාන අතර වඩාත් හොඳ සම්බන්ධීකරණයක් හා සහයෝගිතාවයක් පවත්වාගැනීමටත් අවශ්‍ය වී ඇති බැවින්, මෙම සංවිධාන සියල්ලම එක් ආයතනයක් යටතේ නැවත ලියාපදිංචි කිරීම අවශ්‍ය වී තිබේ.

3. ඉහත කී තත්වය සැළකිල්ලට ගෙන, පහත සඳහන් ස්වේච්ඡා සමාජසේවා සංවිධාන නැවත ලියාපදිංචි කිරීමට රජය තීරණය කර ඇත.

(1) විදේශීය ප්‍රභවයන්ගෙන් මුදල් යොදවනු ලබන ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ ස්වේච්ඡා සමාජසේවා සංවිධාන/රාජ්‍ය නොවන සංවිධාන සියල්ලම රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල මෙන්ම අදාල රේඛීය අමාත්‍යාංශයේ ද අවසරය ඇතිව, සමාජසේවා අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබේ.

(ii) මෙබඳු සංවිධාන සියල්ලක්ම නැවත ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරන විට තමන් නිරත වීමට අදහස් කරන ක්‍රියාකාරකම්වල ස්වභාවය, ක්‍රියාකාරී වන ප්‍රදේශය/ප්‍රදේශ, ඉලක්ක කණ්ඩායම, සේවයේ යොදවන සංඛ්‍යාව, මුදල් ලැබෙන ප්‍රභවයන්, වාර්ෂිකව දැරීමට බලාපොරොත්තු වන වියදම, වාර්ෂිකව රට තුළට ගෙන එන මුදල් ප්‍රමාණය ආදී විස්තර සමාජසේවා අමාත්‍යාංශය යටතේ පිහිටුවා තිබෙන රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ ලේඛකාධිකාරී විසින් සපයන ආකෘති පත්‍රයෙහි සඳහන් කරමින් ස්වකීය යෝජිත ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කළයුතු ය.

(iii) එක් පරිපාලන දිස්ත්‍රික්කයකට වැඩි ගණනක ක්‍රියාකාරී වන සියලුම මෙරට ස්වේච්ඡා සමාජසේවා සංවිධාන ද (රාජ්‍ය නොවන සංවිධාන) රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළයුතු ය. එම සංවිධාන ද ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය කරන තොරතුරු රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ ලේඛකාධිකාරී විසින් සපයන ආකෘති පත්‍රයෙහි ඇතුළත් කොට ඉදිරිපත් කළයුතුය.

4. දිස්ත්‍රික් ලේකම්වරයා/දිසාපති විසින් ස්වකීය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන (රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළ රාජ්‍ය නොවන සංවිධාන හැර) අනිකුත් සියලුම ස්වේච්ඡා සමාජසේවා සංවිධාන දිස්ත්‍රික් මට්ටමින් ලියාපදිංචි කළයුතු ය.

රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවක් එක් එක් දිස්ත්‍රික්කයෙහි පිහිටුවිය යුතුය. මෙම කමිටුවට පහත සඳහන් නිලධාරීහු අයත් වෙති.

| | | |
|---|---|---|
| (i) | දිස්ත්‍රික් ලේකම්/ ආණ්ඩුවේ ඒජන්ත | සභාපති |
| (ii) | දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලයේ ප්‍රධානියා | සාමාජික |
| (iii) | සමාජසේවා විෂය භාර පළාත් ලේකම් | සාමාජික |
| (iv) | පළාතේ ප්‍රධාන ලේකම්වරයාගේ නියෝජිතයෙක් | සාමාජික |
| (v) | ප්‍රධාන ලේකම්වරයා විසින් නාම යෝජනා කෙරෙන සමාජසේවා නිලධාරියෙක් | සාමාජික |

5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේදී ප්‍රාදේශීය ලේකම්වරයා විසින් (රාජ්‍ය නොවන සංවිධාන සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය විසින් ජාතික මට්ටමිනුත්, දිස්ත්‍රික් ලේකම්වරයා විසින් දිස්ත්‍රික්ක මට්ටමින් ලියාපදිංචි කරන රාජ්‍ය නොවන සංවිධාන හැර) තම කොට්ඨාශය තුළ පමණක් ක්‍රියාත්මක වන සියලුම රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කළයුතුය..

6. ස්වේච්ඡා සමාජසේවා සංවිධාන (රාජ්‍ය නොවන සංවිධාන) ලේඛකාධිකාරී විසින් 1998 අංක 8 දරණ පනතින් සංශෝධිත 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජසේවා සංවිධාන ( ලියාපදිංචි කිරීමේ හා අධීක්ෂණය කිරීමේ) පනත ප්‍රකාර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පත් කරනු ලබන්නේය.

7. ස්වේච්ඡා සමාජසේවා සංවිධාන (රාජ්‍ය නොවන සංවිධාන) ලියාපදිංචි කිරීමේ මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට ඔබගෙන් ලැබෙන සහයෝගය බෙහෙවින් අගය කොට සළකමි.

කේ.බාලපටබැඳි
ජනාධිපති ලේකම්